// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2466/04 - 2025 දෙසැම්බර් මස 08 වැනි සඳුදා - 2025.12.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### (262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සභික ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ අංක 13 පිටුවල කොට්ඨාසයට තේරී පත්වූ දොන් ලසන්ත ලාල් ලේකම්වසම් අයත් වන්නා වූ සමගි ජන බලවේගය නම් වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ අංක 13 පිටුවල කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ගාර්දිය හේවාවසම් දිනේෂ් සම්පත් නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, වේවැල්වල හේවගේ රවීන්ද්‍ර විජය කුමාර වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ, අංක 13, පිටුවල කොට්ඨාසයේ සභිකයා වශයෙන් ගාර්දිය හේවාවසම් දිනේෂ් සම්පත් තෝරා පත්කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**ඩබ්ලිව්. එච්. ආර්. විජය කුමාර,**
තේරීම්භාර නිලධාරි,
ඇල්පිටිය ප්‍රාදේශීය සභාව.

2025 දෙසැම්බර් මස 05 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

EOG 12 - 0034



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*